සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- 01 සිට 05 දක්වා දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. රංග විධාන අවශ්‍ය වන්නේ,
    (i) නාට්‍ය රචකයාට ය. (ii) නළු නිළියන්ට ය.
    (iii) ප්‍රේක්ෂකයන්ට ය. (iv) මතක්කර දෙන්නාට ය.

02. නාට්‍යයකට සංගීතය සැපයීමේ දී සංගීත ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,
    (i) නාට්‍යයේ ශෛලියට අනුකූල වීම.
    (ii) නාට්‍යයේ තේමාවට උචිත වීම.
    (iii) සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක් භාවිතා වීම.
    (iv) නාට්‍යයේ රසය මතුකරලීම.

03. නාට්‍යයක් නරඹන්නා,
    (i) ප්‍රේක්ෂකයා (ii) රසිකයා (iii) පාඨකයා (iv) ශ්‍රාවකයා

04. නාට්‍යයකට තිබිය යුතු අත්‍යවශය අංගයකි.
    (i) ගැටුම (ii) ගීත (iii) හාස්‍යය (iv) ශ්‍රාවකයා

05. ඉග්නේෂස් ලොයෙලා මුණිවරයා ගේ කතාව තේමාකොට නිෂ්පාදිත නාට්‍යය වන්නේ,
    (i) සාන්තුවර සෙබලාණෝ ය. (ii) මරිය මවුන් පැමිණීම ය.
    (iii) ස්වරණතිලකා ය. (iv) සඳකිඳුරු ය.

- 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහනින් තෝරා හිස්තැන මත ලියන්න.

  (අංගරචනය / භාව ප්‍රකාශනය / රංග ක්‍රීඩා / නාට්‍යෝචිත /වාචික)

06. නාට්‍යයක දී යම්කිසි ගැටලුකාරී ස්වභාවයක් ...................................... අවස්ථාවක් ලෙස හැඳින්වේ.
07. නළු නිළියන්ගේ මුහුණු චරිතයට උචිත ලෙස සැකසීම ........................................ වේ.
08. හුස්ම ගැනීම හා පිට කිරීමේ අභ්‍යාස මගින් .......................................... අභිනය දියුණු කර ගත හැකිය.
09. නාට්‍ය ගීතයක් ඉදිරිපත් කිරීමේ දී තාලය, ශ්‍රැතිය පමණක් නොව ........................................ ද වැදගත් වේ.
10. ස්මරණය, ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ....................................... අවශ්‍ය වේ.

- 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11. මාෂා සහ වළහා ළමා නාට්‍යයක් නොවේ. ( )
12. අභිරූපණයේ දී දෙබස් භාවිතා නොකරයි. ( )
13. නළුවාගේ බාහිර සමාරෝපය සඳහා වේෂ භූෂණ විශාල බලපෑමක් කරයි. ( )
14. තේමාව යනු නාට්‍ය පෙළින් ප්‍රකාශ වන අදහසයි. ( )
15. සංවාද අයත් වන්නේ ආංගික අභිනයටය. ( )

• අංක 16 -. 20 දක්වා ප්‍රශ්නවලට අදාලව, A කොටසේ දක්වා ඇති කරුණට ගැලපෙන කරුණ B කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 16. ළමා නාට්‍යයකි | • වාචික අභිනය |
| 17. හඬ අභ්‍යාස සඳහා යොදා ගනී | • රංග ක්‍රීඩා |
| 18. නාට්‍ය ගීත | • ඇහැළ මලින් ගස් පිරිලා |
| 19. ලේන්සු හැංගීම | • තොප්පි වෙළෙන්දා |
| 20. නාට්‍ය ගීතයකි | • බුද්ධ ගච්ජය |

**(ලකුණු 1×20 = 20)**

## II කොටස

• **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්ණ 03 කට පිළිතුරු සපයන්න.**

01) **පහත සංවාද ඛණ්ඩ ඇසුරින් පිළිතුරු සපයන්න.**

(වලහා නින්දෙන් අවදි වුවා සේ)

වලහා : හරි හරි හොඳට ගායනා කරා. කොච්චර හොඳට ගායනා කළාද කියනවනම් මට නින්ද යන්න ආවා.

මාෂා : වලස් රාලහාමි ඉතිං මට ගෙදර යන්න පාර පෙන්නනවද?

වලහා : මොන කරදරයක් ද? දැන් ඉතිං මේක තමා ඔයාගේ ගෙදර.

i. ඉහත සංවාද ඛණ්ඩයේ අයත් නාට්‍යයේ නම කුමක්ද? (ලකුණු 02)

ii. මෙම නාට්‍ය නිර්මාණය කළේ කවුරුන් ද? (ලකුණු 02)

iii. මෙහි සඳහන් රංගවිධානයක් ලියන්න. (ලකුණු 02)

iv. මෙම නාට්‍යයේ තේමා දෙකක් ලියන්න. (ලකුණු 02)

v. මෙම නාට්‍යයේ එන තවත් චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

02) i. රංග අභ්‍යාස යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. රංග අභ්‍යාස හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. ඔබ පන්තිකාමරයේ දී සිදු කළ රංග අභ්‍යාසයක් කරන අයුරු විස්තර කරන්න. (ලකුණු 04)

03) i. වේෂ භූෂණ යනු කුමක් ද? (ලකුණු 02)

ii. වේෂ භූෂණ නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු 02 ක් නම් කරන්න. (ලකුණු 04)

iii. පන්ති කාමරයේ දී සරල ලෙස වේෂභූෂණ නිර්මාණය කිරීමට යොදාගන්නා අමුද්‍රව්‍ය 04 ක් ලියන්න. (ලකුණු 04)

04) i. නළුවෙකුට තිබිය යුතු කුසලතා 2ක් ලියන්න. (ලකුණු 02)

ii. නළුවෙකුට තිබිය යුතු ගුණාංග 4ක් ලියන්න. (ලකුණු 04)

iii. ඔබ දන්නා ආනුෂාංගික ශිල්පීන් දෙදෙනෙකු නම් කර, ඔවුන්ගේ කාර්යභාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

05) ඔබ දන්නා ජාතක කතාවක් හෝ ජන කතාවක් ඇසුරු කර ගනිමින් සංවාද, චරිත, දෙබස්, අවස්ථා, රංග විධාන, නාට්‍යෝචිත අවස්ථා සහිත නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න. (ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
Second Term Test - Grade 08 - 2024

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

## ප්‍රායෝගික පරීක්ෂණය

01) නාට්‍ය ගීතයක්, තාලය, රිද්මය, රංගනය සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

02) රංග භාණ්ඩ කිහිපයක් තබා, කැමති භාණ්ඩයක් තෝරාගෙන, එය ඊට අදාළ නොවන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරමින් ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කරන්න. (කාලය වි.03)

උදා ඃ. පෑන . සිරින්ජරය

කොස්ස . ගිටාරය

රබර් බෝලය . අඹ ගෙඩිය (ලකුණු 10)

03) කණ්ඩායම් ක්ෂණික නිරූපණය

- පන්ති කාමරයක්
- සත්තු වත්ත
- පිස්සන් කොටුවක්
- වෙළෙඳ පොලක් (ලකුණු 10)

04) පහත සඳහන් වචන, අර්ථ තුනකින් උච්චාරණය කරන්න.

- කොහෙද යන්නේ?
- ඇත්තටම ද?
- කවුද කියන්නේ ?
- ගෙදර කවුද? (ලකුණු 10)

05) මාෂා සහ වළහා නාට්‍ය පෙළෙහි චරිතයක් රංගනය කරන්න. (ලකුණු 10)